**පාතදුම්බර ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරි තැන්පත් ගිණුමේ ශේෂය වූ රු. 4,732,957 ක් නාගරික සංවර්ධන අධිකාරි අරමුදල් ලෙස ගිණුම්ගත නොකර පොදු තැන්පත් ශේෂයක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ වාහන සේවා මධ්‍යස්ථානයේ වැඩිදියුණුව සඳහා දරන ලද රු.3,800,000 ක් වෙනුවට රු.380,000 ක් ප්‍රාග්ධනීන කිරීමෙන් වත්කම් රු.3,420,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 1,658,539 ක කර්මාන්ත ණය හිමි ශේෂ 02ක් හා රු. 486,750 ක් වූ වාහන සේවා මධ්‍යස්ථානයේ ණය හිමි ශේෂයක් දෙවරක් ගිණුම්ගත කිරීමෙන් රු. 2,145,289 ක් ණය හිමියෝ වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 15 ක ශේෂයන්, උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු. 92,650,087 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | ගිණුම්ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 11,290,290 ක වත්කම් ශේෂ 02 කට හා වගකීම් ශේෂයකට අදාළ උප ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී ලේඛනය නිවැරදිව පවත්වාගෙන යන බව. | නිවැරදිව ලේඛන පවත්වා ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | (i) මු. රෙ 571(3) | 2012 සිට ඉකුත් වර්ෂය දක්වා කාලය ඉකුත් වූ රු.1,928,438 ක මිශ්‍ර තැන්පතු 32 ක් , කඩ කුලී 08 ක් හා කර්මාන්ත අතරුදි 6 ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ** | | | |
| | (ii) 2018 අප්‍රේල් 24 දිනැති අංක 2018/05 දරන චක්‍රලේඛය | පලාත් පාලන කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව පවත්වාගෙන යනු ලබන ජපන් තාක්ෂණික කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා සභාවේ ලේකම්වරිය විසින් 2017 සිට 2020 වර්ෂවල පුද්ගලයින් 05 දෙනෙකු අවිධිමත් ආකාරයට බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු. 1,985,733 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | පලාත් පාලන කොමසාරිස් වරයාගෙන් අනුමැතිය ලබා ගන්නා බව. | චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,164,031 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,529,254 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,793,650 | 7,156,980 | 7,221,788 | 4,854,409 | 57,793,650 | 5,911,146 | 4,344,691 | 4,919,216 |
| (ii) | කුලී | 4,273,152 | 5,064,798 | 4,804,288 | 634,069 | 5,187,560 | 4,185,954 | 4,632,263 | 373,559 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,180,000 | 3,180,000 | 3,572,481 | - | 2,728,000 | 2,728,000 | 3,873,232 | - |
| (iv) | වෙනත් ආදායම් | 70,363,413 | 28,801,367 | 24,620,069 | 95,044,320 | 47,585,763 | 75,798,623 | 57,962.808 | 90,863,022 |
| | | 83,610,215 | 44,203,145 | 40,218,626 | 100,532,798 | 113,294,973 | 88,623,723 | 12,908,149 | 96,155,797 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.4,854,409 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ දේපල 143 කින් එකතුව රු.1,270,284 ක් හා රාජ්‍ය ආයතන දෙකකින් රු. 5,000 වඩා වැඩි ආයතන දෙකකින් රු. 35,596 ක් ක් විය. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් බදු අයකළ යුතුය. |
| (ආ) | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.1,774,828 ක් වූ අතර, එක ඒකකයක ජල ගාස්තු හිඟය රු.5,000 ඉක්මවූ ජල පාරිභෝගික ඒකක 48 කින් එකතුව රු.460,602 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ රු. 1,476,000 ක් වූ ජල ලීටර් 912,000 ක් ජල සම්පාදන මණ්ඩලයෙන් ලබාගෙන කිසිදු ක්‍රමවේදයකින් තොරව නොමිලේ බෙදාහැර තිබුණි. | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ආදායම් අයකරගැනීමට කටයුතු යුතුය. |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.162,998 ක් හා මුද්දර ගාස්තු රු.93,206,494 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අප ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 අනාථරීක ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මඩවල පොදු වෙළඳ සංකීර්ණය 2003 වර්ෂයේ සිට වසා දමා තිබුණු කඩ කාමර 23 ක් කඩා ඉවත් කර රු. 75,308,678 ක ඇස්තමේන්තුවක් මත නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම්කර වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට වාස්තු විද්‍යාත්මක උපදේශන ගාස්තු ලෙස රු. 108,000 ක් ද, ඉංජිනේරු උපදේශන ගාස්තු රු. 100,000 ක් හා මැනුම් කටයුතු සඳහා රු. 47,000 ක් වශයෙන් රු. 255,000 ක් 2020-2021 වසර තුළ ගෙවා | ඉදිරියේදී ඉදිකිරීම් කටයුතු සිදුකරනු බව. | පූර්වයෙන් අනුමත කරගතයුතු සැලසුම් අනුමත කර ශක්‍යතා අධ්‍යයන මත ඉදිකිරීම් ආරම්භ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද අදාළ සැලැස්ම වීථි රේඛා සීමාවට අයත් වී තිබීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලැස්ම නිර්දේශ කර නොතිබීම මත ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. මේ හේතුවෙන් මේ සඳහා වැය කළ මුදල් අනාර්ථික වී තිබුණි. | | |

### 3.3 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා කඩ කාමර බදු දීමේ දී නිසි අධ්‍යානයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් දෙවරක් පුවත්පත් දැන්වීම් පළකිරීමට සිදුවීමෙන් රු. 116,713 ක් සභා අරමුදලට පාඩුවක් සිදුකර තිබුණි. | අඩුපාඩුවක් සිදුවී ඇති බව. | නිසි අධ්‍යානයකින් කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු එළගව මස් වෙළඳසැල සමාලෝචිත වර්ෂය සඳහා බදු දීමේදී ඉදිරිපත් කළ ටෙන්ඩර් පත් ව්‍යාජ ලෙස වෙනස් කර වැඩි මිල ඉදිරිපත් කළ රු.3,100,000 ක ටෙන්ඩරය පිළිනොගෙන රු. 2,811,000 ටෙන්ඩරය පිළිගැනීම නිසා රු. 289,000 ක් සභාවට පාඩු වී තිබුණි. | පළාත් පාලන කොමසාරිස් වරයා දැනුවත් කර ඉදිරි පියවර ගන්නා බව | විධිමත් පරිදි ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සමීක්ෂණ වාර්තා අනුව පුස්තකාල 06 ක රු. 128,758 ක් වටිනා පොත් 654 ක් අස්ථානගතවී තිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.94,750,869 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.111,545 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.3,585,702 ක් අයකර නොතිබුණි. | අයකරගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.20,051,059 ක් වූ අතර ඉදිරිපත් කරන ලද | පරික්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාල විශ්ලේෂණයට අනුව වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.80,000 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.2,911,545 ක් නිරවුල් කර නොතිබුණි. | | |
| (ඇ) | දුම්බර වාහන සේවා මධ්‍යස්ථානය 2021 වර්ෂයේ ආරම්භ කරන ලද අතර එය නිසි සැලසුමකින් හා කළමනාකාරණයකින් තොරව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 505,938 ක පාඩුවක් සිදුව තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | ලාභ උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබූ අතර ඉඩම් 13ක වටිනාකම් හඳුනාගෙන ලේඛනගතගත කර නොතිබුණි. | ලේඛන යාවත් කාලීනව පවත්වා ගැනීමට කටයුතු කරන බව. | ලේඛන යාවක් කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයේ ජල යෝජනා ක්‍රමයක් සඳහා ජල මෝටරයක් මිලදී ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.200,000 ක මුදල අදාළ කාර්යයට යොදවා නොගෙන තැන්පතු වල රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී නිරවුල් කරගැනීමට කටයුතු කර න බව | මුදල් අරමුණුගත කාර්යයකට යොදවාගත යුතුය. |
| (ඊ) | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ලද මහජන පැමිණිලි 115 ක් සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | මහජන පැමිණිලි පරික්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන අනුව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පසුගිය වර්ෂ 05 ක සංවර්ධන බලපත්‍ර 786 ක් අනුමත කර තිබුණද අනුකූලතා සහතික 731ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණද ඒ සම්බන්ධයෙන් පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | -එම- | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2019 වර්ෂයේ ඉදිකිරීමට යෝජිතව පැවති වාහන නැවතුම්පොල සඳහා සුදුසු භූමියක් හඳුනානොගෙන මඩවල ඇල රක්ෂිතයේ අවිධිමත්ව ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් මෙම ඉදිකිරීම අනුමත කර නොතිබුණි.2020 හා 2023 වර්ෂවල මෙම භූමියේ මැනුම් කටයුතු සඳහා රු. 825,255 ක් ගෙවා තිබුණි. | -එම- | සුදුසු භූමියක් තෝරාගෙන ඉදිකිරීම් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඵ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව හා පාතදුම්බර ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ජපන් තාක්ෂණික ස්වායු ස්වයංක්‍රීය හා කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන සඳහා 2016 ඔක්තෝබර් 12 වන දින එකඟතා ගිවිසුමකට දෙපාර්ශවය අත්සන් තබා තිබුණු අතර 2022 ජූලි මස සිට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ගිවිසුම් කඩ වීමෙන් වන මූල්‍ය අලාභය අයකර ගැනීම හෝ ආරවුලක් ඇති වූ විට ක්‍රියාත්මක විය යුතු ආකාරය ගිවිසුමේ සඳහන්ව තිබුණත් විගණිත දිනය වූ සමාලෝචිත වර්ෂය අවසානය විටත් මෙම ගැටළුව නිරාකරණය කරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 නිෂ්කාශර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම හඳුනාගෙන නොමැති ලොරි රථයක් හා ජල බවුසරයක් හා රු.1,600,000 ක් වටිනා කැබ්රථයක් වසර 01 සිට 14 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | අලුත්වැඩියා කිරීමට හා වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන වාහන 05 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව | විධිමත්ව අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | සභාව භාවිතා කරනු ලබන ඉඩම් 06 ක් හා සුසානභූමි 10 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව | විධිමත්ව අයිතිය පවරා ගත යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 11 ක පුරප්පාඩු 16 ක් ද සංවර්ධන නිලධාරි තනතුරෙහි අතිරික්ත 09 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා ආදාල පාර්ශවයන් දැනුවත් කර ඇති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය රාජකාරි සඳහා යොදවාගන්නා බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇති බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |